**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝග නව මූල්‍යයනය සංරචක ව්‍යාපෘතිය - 2020**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝග නව මූල්‍යයනය ආකෘති යටතේ සංරචක ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 26 දින එළඹි අංක 977 - එල්කේ -H-MOH සහ 6728 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ V ව්‍යාස්ථාවේ 5.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය

ප්‍රදාන ගිවිසුමට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාව තුළ HIV/AIDS වැළැක්වීම, පාලනය සහ ප්‍රතිකාර කිරීමේ ජාතික වැඩසටහන් ක්‍රියාකාරකම් පුළුල් කිරීමයි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් එච්.අයි.වී සංරචකය වන එච්.අයි.වී නව අරමුදල් ආදර්ශ සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 607.77 ට සමාන ඇමරිකානු ඩො. මිලියන 3.35 ක් වූ අතර මෙම සම්පූර්ණ මුදල ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය 2016 ජනවාරි 01 දින එහි කටයුතු ආරම්භ කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2021 දෙසැම්බර් දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගනනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, විස්තීරණ ආදායම ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

[[

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය

කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නොසැසඳුන ශේෂයන්

| මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | අනුරූපී වාර්තාව අනුව විස්තරය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| එ. ජ.ඩො<br>102,184 | එ. ජ.ඩො<br>95,323.97 | එ. ජ.ඩො<br>6,860.03 | මාර්ගගත මිලදී ගැනීම්වලට අදාළ ගෙවීම් සඳහා සෘජු මුදල් ගෙවීමේ දැනුම්දීම් නිකුත් කරනු ලබන අතර අනෙකුත් ගෙවීම් සඳහා විද්‍යුත් තැපෑලෙන් තහවුරු කිරීම සිදු කෙරේ. | ගිණුම්වල සංඛ්‍යා මූලාශ්‍ර ලේඛනවලට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| කල් ඉකුත්වීමට පෙර භාවිතා කිරීමට නිසි සැලසුමක් නොමැති වීම හේතුවෙන් රු. මිලියන 5.6 ක් වටිනාකම වූ උපත්පාලන ද්‍රවය 2021 ජූලි සහ 2022 මැයි මාසවල කල් ඉකුත් වී තිබුණි. | අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි | උපත් පාලන ද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර උපරිම උපයෝජනය සහතික වීම සඳහා නිසි සැලසුමක් තිබිය යුතුය |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2010 වසරේ ක්‍රියාත්මක කළ දැනුවත් කිරීමේ වැඩසටහනක කොටසක් ලෙස 2010 වසරේදී වතුකරයේ සේවකයන් අතර ඒඩ්ස් මර්දන පණිවිඩ සහිත ටී ෂර්ට් බෙදා හැරීම සඳහා පෞද්ගලික ආයතනයකට රු. 551,250 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙතෙක් අදාළ ටී ෂර්ට් ලැබී ලැබී නොතිබුණි. එසේම ව්‍යාපෘතිය මගින් ඉහත ආයතනයට ලබා දුන් රු. 88,146 ක මුදල නැවත ව්‍යාපෘතියට ලබා දී නොතිබුණි. ඒ අනුව මුළු මුදල වූ රු. 639,396, අයකර ගැනීමකින් තොරව ගිණුම්වල ලැබිය යුතු අත්තිකාරම් ශේෂය ලෙස අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුණි. | අමාත්‍යාංශයේ නීති දෙපාර්තමේන්තුව අදාළ නීතිමය කටයුතු සිදු කරයි. මේ සම්බන්ධ ප්‍රගතිය ඉදිරියේදී විගණනයට දැනුම් දීමට කටයුතු කරමි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |